www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# කතෝලික ධර්මය

06 ශ්‍රේණිය කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

## I කොටස

- අංක 01 සිට 10 තෙක් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශු. බයිබලයේ පුරාණ ගිවිසුමට අයත් පොත් ගණන වනුයේ,

(1) 27 කි. (2) 73 කි. (3) 46 කි. (4) 23 කි.

02. නව ගිවිසුමේ ඇතුළත් පළමු ග්‍රන්ථ හතර ...................... ලෙස හඳුන්වයි.

(1) පංච පුස්තකය (2) ශුභාරංචි ග්‍රන්ථ
(3) ද්විතීය සම්මත ග්‍රන්ථ (4) නීති පොත්

03. ශු. මතෙව් තුමා ක්‍රිස්තුන් වහන්සේව හඳුන්වන්නේ,

(1) මෙසියස් වහන්සේ ලෙසය. (2) ගැලවුම්කරුවාණන් ලෙසය.
(3) දිවැසිවරයෙක් ලෙසය. (4) මැවුම්කරුවාණන් ලෙසය.

04. දෙවියන් වහන්සේ පක්ෂීන් හා මසුන් මවන ලද්දේ,

(1) පළමු දිනයේ දී ය. (2) හතරවන දිනයේ දී ය.
(3) පස්වන දිනයේ දී ය. (4) හයවන දිනයේ දී ය.

05. ජේසුස් වහන්සේ මෙලොවට පැමිණියේ,

(1) ලොව පාලනය කිරීමට ය. (2) ගැලවීමේ කාර්ය ක්‍රියාත්මක කිරීමට ය.
(3) ප්‍රාතිහාර්ය කිරීමට ය. (4) දේව රාජ්‍ය පිහිටුවීමට ය.

06. දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙතහි බාහිර සලකුණ වනුයේ,

(1) පූප හා මිදි යුෂ ය. (2) ශු. තෛලය ය.
(3) පාස්කු ඉටි පහන ය. (4) කුරුසිය ය.

07. ක්‍රිස්තුස් වහන්සේ අපෝස්තුළුවරුන්ට දර්ශනය වූයේ,

(1) පෙන්තකොස්ත දිනයේ දී ය. (2) පාස්කු ඉරුදින සැඳෑවේ ය.
(3) මහ බ්‍රහස්පතින්දා දින දී ය. (4) ගොබ් ඉරිදා ය.



agaram.lk

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

08. 'දූරා' ස්ථානයේ තැබූ රන් රූපයට වන්දනා නමස්කාර කළ යුතු බවට රාජ ආඥාවක් නිකුත් කළ රජතුමා වනුයේ,

(1) පිලාත් රජු ය. (2) පාරාවෝ රජු ය.

(3) හෙරෝද් රජු ය. (4) නෙබුකද්නෙසර් රජු ය.

09. දේව දරුකම නමැති නොමැකෙන ලාංඡනය කිතුණුවන් තුළ සනිටුහන් වන දේව ප්‍රසාද නිධානය වන්නේ කුමක්ද?

(1) අභිවෘද්ධි ආලේපය (2) ප්‍රසාද ස්නාපනය

(3) දිව්‍ය සත්ප්‍රසාදවහන්සේ (4) රෝගීන්ගේ ආලේපය

10. "ඔබ යමෙකුගේ පව් කමා කරන්නහු ද ඒවා ඔවුන්ට .............................. ලැබේ.

(1) දඬුවම් කරනු (2) ආශිර්වාද කරනු

(3) කමා කරනු (4) දයාව කරනු

- **අංක 11 - 15 දක්වා නිවැරදි වාක්‍යයට (✓) ලකුණද, වැරදි වාක්‍යයට (X) ලකුණද යොදන්න.**

11. ශු. මාක් තුමා ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරයෙකි. ( )

12. දෙවියන් වහන්සේ පළමු දිනයේ දී අහස හා ජලය මැවූ සේක. ( )

13. ඕනෑම අවස්ථාවක දෙවිඳුන්ගේ නාමයෙන් දිවිරීමට අපට හැකිය. ( )

14. මෝසෙස් තුමා දස පනත ලබා ගැනීමට පෙර දින 40 ක් යාච්ඤා කළ සේක. ( )

15. ආරම්භක දේව ප්‍රසාද නිධාන 03 කි. ( )

- **අංක 16 - 20 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරා ලියන්න.**

( ජීවන හුස්ම / 04 කි. / අයකැමියෙකි / 02 කි. / හිරුඑළිය / යාච්ඤාව )

16. ශු. මතෙව් තුමා කැඳවීමට පෙර .................................................................................................. කි.

17. දෙවියන් වහන්සේ මිනිසාගේ නාස් පුඩුතුළට ............................................................................ හෙළු සේක.

18. දේව ප්‍රසාද නිධානයක ප්‍රධාන ලක්ෂණ ...................................................................................... ක් ඇතුළත් වේ.

19. දෙවියන් වහන්සේ දුදනන්ට හා සුදනන් හට තම ..................................................................... උදා කරවන සේක.

20. සුවය දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන ........................................................................................... කි.

(ල. 2 × 20 = 40)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

06 ශ්‍රේණිය | II කොටස | කතෝලික ධර්මය

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

01. (i) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් 02 ක් ලියන්න.
(ii) ශුභාරංචි ග්‍රන්ථ 02 ක් ලියන්න.
(iii) බිළිඳු ජේසු බැහැදැකීමට ගිය ශාස්ත්‍රවන්තයන් ගෙන ගිය දේවල් 02 ක් ලියන්න.
(iv) සුව දානය කිරීමේ දේව ප්‍රසාද නිධාන 02 ක් නම් කරන්න.
(v) ශු. ජොහාන් තුමාගේ මව හා පියා නම් කරන්න.
(vi) දෙවියන් වහන්සේ මිනිසාව මවන ලද උන්වහන්සේගේම ලක්ෂණ 02 ක ලියන්න.
(vii) ප්‍රසාද ස්නාපනයේදී භාවිතා කරන ලද සංකේත 02 ක් ලියන්න.
(viii) සබත් දවසේ දී නොකළ යුතු කාර්යයන් 02 ක් ලියන්න.
(ix) සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය නිසි ලෙස ලබා ගැනීමට අවශ්‍ය පියවර 02 ක් ලියන්න.
(x) චතාරික සමයේ ඔබ කරනු ලබන භක්ති අභ්‍යාස 02 ක් ලියන්න. (ල. 2 x 10 = 20)

02. (i) ශු. බයිබලය රචනා කිරීමේ දී පදනම් කරගත් කරුණු 02 ක් ලියන්න. (ල. 02)
(ii) පැරණි ගිවිසුමේ අඩංගු පොත් 03 ක් ලියන්න. (ල. 03)
(iii) ශු. බයිබලය ගෞරවාන්විතව පරිහරණය කිරීමේදී කළ යුතු කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

03. (i) පාස්කු අභිරහස යනු කුමක්ද? (ල. 02)
(ii) ශ්‍රී ලංකාවේ කතෝලිකයන්ට නියම වන ණය මංගල්‍යයන් 03 ක් ලියන්න. (ල. 03)
(iii) ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීමට කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

04. (i) ශු. සභාව තුළ ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමීත්වය ලබමින් සතුරන්ට ප්‍රේම කළ පුද්ගලයින් 02 ක් ලියන්න. (ල. 02)
(ii) අසල්වැසියන්ට ප්‍රේම කිරීමට උගන්වන දේව පනත් 03 ක් ලියන්න. (ල. 03)
(iii) ඔබට සතුරුකම් කරන අයට යහපත කිරීමට ඔබට කළ හැකි කාර්යයන් 05 ක් ලියන්න. (ල. 05)

05. (i) සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන 02 ක ලියන්න. (ල. 02)
(ii) දෙමව්පියන් වෙනුවෙන් දරුවන් ඉටු කළ යුතු යුතුකම් 03 ක් ලියන්න. (ල. 03)
(iii) පූජා ප්‍රසාදිතුමන්ලාගේ සේවාවන් 05 ක් ලියන්න. (ල. 05)

06. (i) දේව ප්‍රසාද නිධානයක් යනු කුමක්ද? (ල. 02)
(ii) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ නමැති දේව ප්‍රසාද නිධානය තුළ ඇතුළත් ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)
(iii) දිව්‍ය සත්ප්‍රසාදය ලබා ඇති ඔබ දේව දරුවකු ලෙස ක්‍රියාකරන ආකාර 05 ක් ලියන්න. (ල. 05)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk